ලක්ෂ්මි වසර සියයක් සපුරයි

'නවකතාව' නම් වූ සාහිත්‍යාංගයේ දීර්ඝ කාලීන පැවැත්ම තහවුරු කිරීමට නම් එය රුචිකර කියවීමකට මංපෙත් විවර කළ යුතු යැයි අපි සිතමු. නවකතාවක් නිර්මාණය විය යුතු වන්නේ බුද්ධිමතුන්, විද්වත් පාඨකයන් සඳහා යැයි යමෙක් කල්පනා කරන්නේ නම් ඒ හේතුවෙන් ම එහි චිර ජීවනයට වැට බැඳෙන බව ය, අප ගේ කල්පනාව වන්නේ.

විසිවන සියවසේ මේ රටේ නවකතාව පෝෂණය කළ නවකතාකරුවන් අතළොස්ස ගමන් කළේ එක ම මාවතක නො වේ. පියදාස සිරිසේන, මාර්ටින් වික්‍රමසිංහ හා ඩබ්ල්යු. ඒ. සිල්වා දෙස පමණක් බැලුව ද ප්‍රකට වන්නේ මේ සත්‍යය යි. විවිධ මාවත් ඔස්සේ නවකතාව පෝෂණය කළ ඔවුහු විවිධ පාඨකයන්ගේ ස්මරණ ලෝකයේ නොමැකෙනලුසු සලකුණු තැබීමට සමත් වූහ. 'නවකතා චක්‍රවර්ති' යන විරුදාවලිය ලැබූ සිල්වා සූරින් සම්භාවනාවට පාත්‍ර වුණේ රසවත් හා කියවීමේ රුචිය වැඩූ නවකතාකරුවා ලෙස ය. මේ රටේ නවකතාවකින් නිෂ්පාදනය වූ සිංහල චිත්‍රපට අතරින් අතිමහත් බහුතරයක් සඳහා සිල්වා සුරින්ගේ කෘතීන් යොදාගෙන තිබීමෙන් ම ඔහු ගේ ජනප්‍රියත්වය විශද වෙයි.

භාෂා සාහිත්‍ය දැනුමෙහි පාරප්‍රාප්ත වීම සඳහා සිල්වා සුරින් ඇසුරු කළ ගිහිපැවිදි පඬිවරුන් බොහෝ ය. 'ලක්මිණි පහන' පුවත්පතේ ඔහුගේ පළමු ලිපිය පළ කළ (ලක්මිණි පහන සංස්කාරක) මාතර ධර්මරත්න පඬිතුමා ද එවැන්නෙකි. 1907 වසරේ සිය ප්‍රථම නවකතාව එළිදක්වන විට ද සිල්වා සුරින්ගේ භාෂා සාහිත්‍ය ඥානය මැනවින් කළුමැදී තිබුණේ පුවත්පත් ලිපි සම්පාදනයෙහි මෙන් ම පොතපත පරිශීලනයෙහි ද අඛණ්ඩවම යෙදී සිටි නිසා බවට සැක නැත. 'සිරියලතා' නවකතාව නිර්මාණය වීමේ පසුබිම් හේතු ඔහු මෙසේ විස්තර කරන්නේ ඒ අනුව ය.

''පුවත්පත්වල මගේ ලිපි පළවීමෙන් ලත් අනුබලයෙන් වඩාත් ලොකු වැඩක් අතට ගැනීමට මා සිත පෙළඹුණේ ය. සිරියලතාව පටන් ගැනුණේ මේ කාලයේ ය. පියදාස සිරිසේන මහතාගේ පොත පත නිසා අමුතු කියැවීම් ලෝකයක් මැවුණේ ය. මේ කියැවීම් ලෝකයෙන් මගේ සිරියලතාවට ද අනුග්‍රහය ලැබුණි.''

පුවත්පත් ලිපි ගණනාවක් සම්පාදනය කිරීමෙන් අනතුරු ව 1919 වසරේ දී ඩබ්ල්යු. ඒ. සිල්වා සූරින් අත ගසා ඇත්තේ තවත් අලුත් වැඩකට ය. ඒ, 'සිරිසර' සඟරාව පටන් ගැනීම යි. පතපොත කියවීමෙන්, සිරියලතා නවකතාව ලිවීමෙන් හා පුවත්පත් සංස්කාරක ජීවිතයෙන් ලැබූ පන්නරයේ අග්‍රඵලය වූයේ 'ලක්ෂ්මි' නම් වූ අපූරු ඓතිහාසික නවකතාවේ උත්පත්තියයි. 'සිරිසර' සඟරාවේ ද කොටස් වශයෙන් (කොටස් කිහිපයක් පමණක්) පළව තිබූ ලක්ෂ්මි නවකතාව එළිදැක්වීමෙන් පසුව මල් මෙන් ම ගල්මුල් ද සිල්වා සූරින්ට එල්ල වූ බව තේරුම් යන්නේ ඒ සම්බන්ධයෙන් පළ කර ඇති යට දැක්වෙන අවධාරණය හේතුවෙනු යි.

''සිරියලතාවේ ලිහිල් බස නිසා මට බොහෝ දෙනෙකු ගේ කන්කෙඳිරිය ඉවසන්නට සිදු විය. එ හෙයින් ම ලක්ෂ්මිය උසස් බසින් ලිව්වෙමි. එ විට ද එහි උසස්කම වැඩි නිසා බොහෝ දෙනෙක් කන්කෙඳිරි ගාන්නට වූහ.

කේ.ඩී.පෙරේරා පුත්‍ර සමාගමෙන් ලක්ෂ්මියේ පිටපතක් ගෙන්වා ගත් ගුරු මහතෙකු එම පිටපත ආපසු එවමින් ඒ වෙනුවට වෙන ඕනෑම පොතක් දෙන ලෙස ඉල්ලුම් කළ ලියුමක් ඒ අතර මට කියවන්නට ලැබුණු හෙයින් මගේ දොම්නස තවත් වැඩි විය.''

සිල්වා සූරින් මේ එළිදක්වන්නේ මේ රටේ සාහිත්‍ය සමාජයේ පොදු ස්වභාවය දැයි අපට සිතෙයි. කෙසේ වුව ද ලක්ෂ්මි එළිදැක්වීමෙන් පසු ඒ පිළිබඳ කතාබහක් සමාජයේ ඇති වූ බව නම් නොරහසකි. නවකතාවේ කතා තේමාව, භාෂා ශෛලිය, සිද්ධි විකාශනය ආදිය සම්බන්ධයෙන් විවිධ අදහස් කලඑළි ගැන්වෙද්දී නවකතාව හා එහි ගම්භීර පසුබිම පිළිබඳව ද විස්මිතව සිටි සමහරුන්ගේ අදහස වී ඇත්තේ මෙවැනි නවකතාවක් රචනා කිරීමට තරම් ප්‍රාගුණ්‍යයක් සිල්වා සූරින් සතුව ඇතැයි සිතිය නොහැකි බව ය; නිසැකයෙන්ම එය රචනා කරන්නට ඇත්තේ අතිපූජ්‍ය පැළෑනේ ශ්‍රී වජිරඤාන හිමිපාණන් විය හැකි බව ය, ඔවුනගේ අදහස වුණේ.

මේ කතාව ඇසූ වජිරඤාන හිමියන් ඊට පිළිතුරු වශයෙන් සිල්වා සූරින්ට පවසා ඇත්තේ සුපුරුදු හාස්‍ය රසය මුසු කතාවකි.

''මේ උන්නාන්සේලාට පිස්සු වෙන්න ඕනෑ. මේ උන්නාන්සේලා මහත්මයා නොදන්නා එක පුදුමයක් නොවෙයි. පුදුමය මෙපමණ ළඟින් ආශ්‍රය කරන්නට වෙලාත්, තවමත් මා නොදන්නා එකයි'' යනුවෙන් කිසියම් සඟනමක ගෙන් ප්‍රශංසා මුඛයෙන් තමන් වහන්සේ ලත් ලියුමක් මට පෙන්වමින් කීහ.

සිල්වා සූරින් සමීපව ඇසුරු කළ පැවිදි පඬිවරුන් අතරේ පැළෑනේ ශ්‍රී වජිරඤාන හිමියෝ ද වෙති. ඒ ඇසුර පිළිබඳව සිල්වා සූරින් තබා ඇත්තේ මෙවැනි සටහනකි.

''වජිරඤාණ හාමුදුරුවන් ගෙන් මා ගුරුකම් ලත් බව ඇත්තයි. එහෙත් ඒ හාමුදුරුවන් ගෙන් මගේ නවකථාවකට හෝ වෙන අන් ලිපි සම්පාදනයකට වචන මාත්‍රයකින් හෝ වුවදෙසක් නොලත් බව මෙහි දී කිය යුතුයි. පොතක් අච්චු ගැසුනාට පසු ඒ මාගේ ආචාර්යයන් වහන්සේට එයින් පිටපතක් තුටු පඬුරු කිරීම සිරිතක් වශයෙන් කැරුණා විනා, එයින් ඔබ එය ගැන උන්වහන්සේ ගේ අදහස වත් මම කිසි කලකත් නොවිතාළෙමි. උන්වහන්සේ ද මගේ වැඩ සම්බන්ධයෙන් සිය අදහස් මා ඉදිරියේ නම් කිසි විටකත් නොපැවසූ හ.

වජිරඤාණ මහ නායක මා හිමියන් වහන්සේට මා ගරු කළේ මට ගුරුකම් දුන් නිසා ම නොවේ. මගේ වැඩි ගෞරවය පිරිනැමුණේ, උන්වහන්සේගේ සිල්වත් කම නිසායි. ශ්‍රමණ සාරූප්‍ය නොවන නොනිසි ප්‍රයෝජනයක් මම කිසි කලකත් උන්වහන්සේ ගෙන් නො ලැබුවෙමි. ඉදින් යම් ලෙසකින් එසේ ලබන්නට ගියා නම් ඒ හාමුදුරුවන් ආශ්‍රය මට එපමණකින් ම නැති වෙන්නට ද තිබිණි''.

ඩබ්ලියු. ඒ. සිල්වා සූරින් ගේ 'හිඟන කොල්ලා' නවකතාවට සියක් වසක් සපිරුණේ මේ වසරේ දී ය (2023). එතුමා ගේ විශිෂ්ට ගණයේ නවකතාවක් ලෙස පොදුවේ පිළිගැනෙන 'ලක්ෂ්මී' අවුරුදු 100 සම්පූර්ණ කළේ පසුගිය (2022) වසරේ දී ය. ඒ අනුව මේ ලිපියේ අරමුණ වන්නේ ලක්ෂ්මි පිළිබඳ ස්මරණයන් කිහිපයකට යළි ජීවය ලබාදීම ය.

ලක්ෂ්මි නවකතාව දිගහැරෙන්නේ කිසියම් රහස් පරීක්ෂක මෙහෙයුමක් පිළිබඳ කුතුහලාත්මක බලාපොරොත්තු පාඨක මනසේ දල්වමිනි. පීටර් විජයසිරි නම් වූ පොතේ කතානායකයා සමඟ ජයනායක නම් වූ තැනැත්තා නොසිතූවිරූ ආකාරයේ පැහැර ගැනීමකට ලක් වෙයි. ඔවුන් සිරකර තැබෙන්නේ එතෙර පිහිටි අද්භූත කඳුකර ප්‍රදේශයක ය. පීටර් විජයසිරි මේ සිරගෙයින් පලා යන්නට සමත් වන මුත් යළිත් වරක් ඔහු, තමා ගේ පොදු සතුරා වන සිරිමල් බණ්ඩාට හසුවෙයි. ඉනික්බිතිව පීටර් විජයසිරිට මුහුණ පාන්නට සිදුවන්නේ මන්ගන් කන්ද නම් වූ අද්භූත කඳුවැටියක නිධානයක් ලබාගැනීම සඳහා නරබිල්ලක් බවට පත්වීමේ අවදානමට ය. මේ ඝාතන ප්‍රයත්නයෙනුත් පීටර් විජයසිරිට ගැළවෙන්නට හැකි වන්නේ හදිසියේ කඩාපාත් වන විදේශ ආක්‍රමණයක්

හේතුවෙනි. අවස්ථාවෙන් ප්‍රයෝජනය ගෙන යළිත් පැනයන්නට වූ පීටර් විජයසිරි සමඟ යළිත් වරක් සටනට එළඹෙන්නේ සිරිමල් බණ්ඩා ය. ලක්ෂ්මි හෙවත් නොනැසෙන රැජිනගේ සම්ප්‍රාප්තිය සිදුවන්නේ මෙ තැන දී ය.

ලක්ෂ්මිය ගේ සම්ප්‍රාප්තිය ඩබ්. ඒ. සිල්වා සඳහන් කරන්නේ මෙ සේ ය.

''එපා, ඔය බානසුල්ලාට යටත් වෙන්න එපා! ඔහුට පාඩමක් උගන්වන්න නම් මෙන්න, මෙන්න, කඩුවක්, යි රජත කිකිණියකින්* නිකුත් මදුර සරවන් හඬක්* මෙහි දී විජයසිරිට ශ්‍රවණාය වී හැරී බැලුවේ ය. එ කල, ඔහු දෙ නෙතට හමු වූ දර්‍ශනය කෙ සේ වර්‍ණනා කරමු ද? දිව්‍යාප්සරාවක වන්* මනොඥ* රූපශ්‍රියෙන්* යුත් තරුණාඞ්ගනාවක්* ඝන වලා ගර්භයකින්* නිෂ්ක්‍රාන්ත* පූර්‍ණ චන්ද්‍රයකු මෙන් කැලෑ රොදකින් නිකුත්ව, කිරණින් ලෙළෙන අසිපතක් දිගු කර සිටියා ය. මේ භාසන්ත දර්‍ශනයෙන්* අප වීරයා මෙන් ම බංඩාර තරුණයා ද, වශීකෘතව* භ්‍රාන්ත විය. මේ දෘශ්‍ය කාව්‍යයෙහි* නිකෘෂ්ට* ක්‍රියෙන්ද්‍රියක්* නූවූ මේ යුවති තොමෝ උෘන විංශති* ප්‍රමාණ වයස් වූ ස්නිග්ධ* කෘශාඞ්ග කොමල ශරීර* ඇත්තී ය. දෙකකුල් වළලුකර සීමාකොට සිටි ඇයගේ ඝන නීල වර්‍ණ* මෘදු කෙශකලාපය ධරණිතලාවතීර්‍ණ* දිව්‍යාංඞ්ගනාවක විසින් අහසින් නෙලන ලද වලාකඩක් මෙන් වී, අර්ධ චන්ද්‍රාකාර* ඇයගේ ලලාටස්ථලය* වෘහස්පතිහුගේ නොහොත් ප්‍රඥා නමැති දිව්‍යාඞ්ගනාවගේ වාසය පිණිස ක්ෂීර වර්‍ණ* ගරුඬ පාෂාණයෙන්* කැර වූ සිහසුනකි* ඉන්ද්‍රචාපශ්‍රිය* උද්වහනය කළ* භ්‍රූ යුග්මයත්,* නීලොත්පල වර්‍ණ* අක්ෂි ගෝල ද්වයයෙන්* හා මෘදු දීර්ඝ රොම සමාකීර්‍ණ* අක්ෂි පක්ෂ්මයන්ගෙන්* ද මොනවට සැදුම් ලත් සිහිල් මඳ ලස බැල්මෙන් අනූණ කාන්තිමත් නෙත්‍ර යුග්මයත්, කරණාකොට ගෙන ශ්‍රේෂ්ඨොන්නතධිවර වෙශයත්* චිත්තාකර්ෂකර* වූ නාරි ලාලිත්‍යයත්* පළ විය''.

ලෝකයේ එදා මෙදා තුර බිහිවූ කලාසාහිත්‍ය නිර්මාණ සියල්ල පාහේ ප්‍රතිනිර්මාණයන් ය. බොහෝ නිර්මාණකරුවන් විසින් කලාසාහිත්‍ය නිර්මාණයන් කලඑළි ගන්වන්නේ එතෙක් පැවැති දෙයක් අපූර්වත්වයකින් යුතුව ප්‍රතිනිර්මාණය කිරීමෙනි. රයිගර් හැගාඞ්ගේ 'ෂී' ගෙඩිපිටින් ගෙන 'ලක්ෂ්මි' රචනා කෙරුණු බවට චෝදනා එල්ල වෙද් දී ඩබ්ල්යු. ඒ. සිල්වා සූරින් ඒ පිළිබඳව කියන්නේ මෙවැනි කතාවකි.

''මාගේ ම ප්‍රතිභාන ශක්තියෙන් නිර්මාණය කළ දෙයට පවා පැසසුමක් නොදෙන යම් යම් අය, මා අනුන්ගෙන් ගත් දෙය වෙනුවෙන් කුමක් නොකියක් ද? එසේ ගැනීමෙන් මා කළේ ආදි යුගයේ සිට ඉංග්‍රීසි නවකතාකාරයන් හා නාටකාචාරයන් ඉතාලි ඉස්පාඤ්ඤ ප්‍රංශ ගත්කරුවන් ගෙන් නොයෙක් දෙය ගෙන ස්වකීය සාහිත්‍යය පෝෂණය කළාක් මෙන්, සිය බස පොහොසත් කිරීම විනා තවත් අය දැනු දු කරන්නාක් මෙන් නිගා දෙන සිඟා කෑමක් නොවේ''.

ඩබ්ල්යු. ඒ. සිල්වා සූරින්ගේ ලක්ෂ්මි නවකතාවට පාදක වී ඇත්තේ සිංහල නවකතාවේ මින් පෙර නොවූ විරූ තේමාවකි. එය කාලයේ මාරක හස්තයෙන් අත්මිදුණු සදාකාලික ස්ත්‍රියක්, නොනැසෙන රැජිනක් පාඨකයා හමුවට ගෙන එයි. ලක්ෂ්මි යැයි කියන්නේ හැගාඞ්ගේ 'ෂී' නමැති ග්‍රන්ථයේ සැකිල්ලක්, කලල රූපයක් විය හැකි වුණ ද ලක්ෂ්මිට ලේ-මස් ලබාදෙන්නේ ඩබල්යු. ඒ. සිල්වා සූරින් ම ය.

ලක්ෂ්මි නවකතාවේ උත්කෘෂ්ට අතුරුපල දෙකක් පිළිබඳව ද මෙහිදී සඳහන් කළ යුතුව තිබේ. ඒ එකක් නම් ඩී. වී. සෙනෙවිරත්න නම් වූ අග්‍රගණ්‍ය ලේඛකයා විසින් ඩබල්යු. ඒ. සිල්වා ගේ ලක්ෂ්මි නවකතාවේ ආභාසයෙන් (1966 වසරේ) රචනා කරන ලද 'ලක්ෂ්මි ආපසු එයි' නම් වූ අපූරු නවකතාවයි. 'හිඟන කොල්ලා' නම් වූ ජනප්‍රිය නවකතාව එළිදුටුවේ ද ලක්ෂ්මිට ලැබුණු ප්‍රතිචාර, විවේචන හේතුවෙන් ම යැයි සිල්වා සූරින් පවසයි.

විශිෂ්ට කෘතියකින් ආභාසය හා උත්තේජනය ලබා, එහි සෙවණැල්ල පතිත කරමින් නව කෘතියක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් විශිෂ්ට ලෙස අත්හදා බැලීම් කළ මහා ලේඛකයා ලෙස අප හඳුනාගන්නේ ඩබ්. ඒ. සිල්වා ය. ඒ පිළිබඳව සිල්වා සූරින් සපයන නිදසුනක් මෙසේ අප ගෙනහැර දක්වන්නේ අරාබි නිසොල්ලාසය ඇසුරින් රචිත 'එක් දහස් එක් රැය' කෘතියේ පාදක සටහනකිනි.

''අරාබි ග්‍රන්ථය මෙතැන් සිට දෙතුන් පෙළක් අශ්ශිල පදයෙන් යුක්ත ය. පදගතාර්ථය දෙන ඉංග්‍රීසි අනුවාදනයෙන් හෙ ද ඒ සේ ම දක්වති. අපි එ සේ නො කරමු.''

ඩබ්ලියු. ඒ. සිල්වා යැයි කියන්නේ නවකතාව ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ හසළ දැනුමක් තිබූ දුර්ලභ ගණයේ බුද්ධි ජීවියකුට ය. පාඨකයා ගේ කුතුහලයට විසල් අවකාශයක් විවර කළ ඔහු ගේ බොහෝ නවකතාවල අවසානය සලකුණු වන්නේ පාඨකයාට කිසියම් හේතුඵල දහමක් ද නිරාවරණය කරදෙමිනි. මීට නිදසුන් වශයෙන් 'ලක්ෂ්මි' නවකතාවේ අවසාන ඡේදය පමණක් මෙසේ දැක්වීම සුදුසු යැයි සිතමි.

''ලක්දිව මහ වනයෙන් සැදුම් ලත් එක්තරා කඳු රැළියක, මිනිසෙක් ගැඹුරු ගල් ලෙනක් වාසය කොට ගෙන, නුදකලාව වෙසෙන්නේ ය. ඔහුට රෙදි කඩකුත්, බැනියමකුත්, සළුවකුත් ඇඳුම විය-වන පල අහර විය. වියළි තණ රොඩු අතුරන ලද මෙට්ටයක, ඔහු නිඳන්නේ ය-ඒ බඳු ම මෙට්ටයක, ඔහු වාඩි වෙන්නේ ය-ඒ බඳු ම මෙට්ටයක, ඔහු හාන්සි වෙන්නේ ය. ඔහුගේ ගිරිලෙන-සියතින් ම මැටි පිරිබඩලා ඉතා පිරිසිදු ලෙස සරලන ලද ගිරිලෙන-දිවා භාගයෙහි සූර්ය රශ්මියෙනුත්, නිශාභාගයෙහි කැකුණා පන්දම්වලිනුත් ආලෝකවත් විය. ඔහුට ස්නානය පිණිසත්, පානය පිණිසත් පිරිසිදු දිය වහනය වන උල්පතකුත් සමීපයෙහි ම ඇත්තතේ ය. ඔහුට කතා බස් කිරීමට කිසිවෙක් නැති. රාක්කයක අසුරන ලද පොත් කිහිපයෙන් එකක් එකක් බැඟින් ගෙන, ඔහු විටින්-විට කියවන්නේ ය. ඇතැම් විට, ඔහු වන පළතුරු සොයමින් ඔබ-මොබ හැසිරෙන්නේ ය. ඇතැම් විට, සක්මනින් ශරීර ව්‍යායාමය කරන්නේ ය. ඇතැම් විට, සිනිඳු කැටයමින් නිමවන ලද කුඩා සමුද්ගයක් වැනි රත්සඳුන් කැටයක් ගෙන සුසුම් ලමින් ඒ දෙස බලාගත් වන ම සිටින්නේ ය. මේ රත්සඳුන් කැටය නිතොරව ම අතට මැදුමෙන් ඔප වැටී එයින් ඔහු මුහුණ පවා පෙනේ. දිගට වැඩුණු රැවුළත්, දිගට වැඩුණු සිහින් හිසකේත් නිසා ඔහුට ඇතැම් විට, තමා ද හඳුනා ගත නොහැකි යි. එහෙත් මුහුණේ තැන, තැන තිබෙන වසූරි කැළල් නිසාත්, විටින්-විට දර්ශනයකින් මෙන් පෙනෙන ලක්ෂ්මියගේ රූප විලාසය නිසාත්, තමා පීටර් විජයසිරි බව හේ දන්නේ ය''.

'ලක්ෂ්මි' නවකතාව සිය වසරක් ඉක්මවා ඇති බව සැබෑ ය. එහෙත් අද දවසේ මුල්වරට 'ලක්ෂ්මි' කියවන - නූතනයකුට වුව ඉන් නොමඳ වින්දනයක් මෙන් ම ආලෝකයක් ද සම්පාදනය වන බව ය, ඉඳුරා ම පැවසිය යුතු වන්නේ.

රවි තිලකවර්ධන